# බස්නාහිර පළාත් ලේකම්වරුන්ගේ රැස්වීම් වාර්තාව

දිනය : 2023.12.28

වේලාව : ප.ව.3.30

ස්ථානය : ප්‍රධාන ලේකම් රැස්වීම් ශාලාව

**මූලාසනය : ප්‍රදීප් යසරත්න මහතා (ප්‍රධාන ලේකම්)**

සහභාගී වූ නිලධාරීන්ගේ නාම ලේඛනය

| | | | |
|---|---|---|---|
| 01) | පී.සෝමසිරි මහතා | - | ආණ්ඩුකාර ලේකම් (බ.ප.) |
| 02) | තිලක් සෙනරත් මහතා | - | ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප) |
| 03) | යූ.බී.ආර්.රාජපක්ෂ මහතා | - | සභා ලේකම්, සභා ලේකම් කාර්යාලය (බ.ප) |
| 04) | සිරිසෝම ලෙකුවිතාන මහතා | - | ලේකම්,අධ්‍යාපන අමාත්‍යාංශය(බ.ප) |
| 05) | කේ.චම්පා එන්. පෙරේරා මිය | - | ලේකම්,ප්‍රවාහන හා මාර්ග අමාත්‍යාංශය(බ.ප) |
| 06) | ඒ.ඩී.එස්.සදීකා මිය | - | ලේකම්,පළාත් පාලන අමාත්‍යාංශය(බ.ප) |
| 07) | ඩී.පී.වික්‍රමසිංහ මයා | - | ලේකම්,කෘෂිකර්ම අමාත්‍යාංශය(බ.ප) |
| 08) | එල්.ඒ.කළුකපුආරච්චි මයා | - | ලේකම්,සෞඛ්‍ය අමාත්‍යාංශය(බ.ප) / නියෝජ්‍ය ප්‍රධාන ලේකම්( වැ.බ) (පාලන) |
| 09) | ඩබ්ලිව්.ටී.ඒ.මානෙල් මිය | - | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) |
| 10) | ඒ.එම්.එස්.මල්කාන්ති මිය | - | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය) |
| 11) | කේ.ඒ.ඩී.කේ.සිරිවර්ධන මහතා | - | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) |
| 12) | කේ.ආර්.අබේසිරිවර්ධන මහතා | - | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) |
| 13) | පී.පී.විජේවීර මිය | - | ප්‍රධාන අභ්‍යන්තර විගණක |
| 14) | පාලිත අබේවර්ධන මහතා | - | ප්‍රධාන නීති නිලධාරී |
| 15) | කේ.එන්.සූරියආරච්චි මිය | - | සහකාර ප්‍රධාන ලේකම් (පාලන) |

ප්‍රධාන ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් 2023.11.29 දින පැවති ලේකම්වරුන්ගේ රැස්වීමේදී එළඹි තීරණ පහත පරිදි වේ.

| අනු අංකය | කාරණය | තීරණය | ක්‍රියාත්මක කිරීමේ බලධාරියා |
|---|---|---|---|
| 01 | බහු කාර්ය සංවර්ධන සහයකයින් PL2 PL3 කාණ්ඩයට ඇතුලත් කිරීම සම්බන්ධව | බහු කාර්ය සංවර්ධන සහයකයින් PL2 හා PL3 කාණ්ඩයට ඇතුලත්කර රියදුරු පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා 66 දෙනෙකුට පත්වීම් ලබා දී අමාත්‍යාංශවල පවතින පුරප්පාඩු සඳහා පත් කිරීමට කටයුතු කළ බවට නියෝජ්‍ය ප්‍රධාන ලේකම් ( පිරිස් පුහුණු) විසින් ප්‍රකාශ කරන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් පුහුණු) |
| 02 | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සම්බන්ධව | 2023. වර්ෂයේ අමාත්‍යාංශ මට්ටමින් ප්‍රතිපාදන වෙන් කිරීමේ වර්තමාන භෞතික ප්‍රගතිය ගත් කල මේ වන විට සියළුම අමාත්‍යාංශ 95% ඉක්මවා ඇති බවත් මූල්‍ය ප්‍රගතිය ගත්කල සෞඛ්‍ය අමාත්‍යාංශය 88% ක් , අධ්‍යාපන අමාත්‍යාංශය 85% ක් ලෙස හා අනිකත් අමාත්‍යාංශ 75% ක් ඉක්මවා ඇති බවත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) විසින් කරුණු ඉදිරිපත් කරන ලදී.<br>තවද මේ වන විටත් සිදු කරන ලද ව්‍යාපෘතිවලට අදාළව බිල් ඉදිරිපත් කරමින් පවතින බැවින් මූල්‍ය ප්‍රගතිය ඉදිරි දින කිහිපය තුල 90% ට ළඟා විය හැකි බවත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය) වැඩි දුරටත් සඳහන් කරන ලදී.ඒ අනුව 2023.12.29 දින වන විට සියලුම බිල්පත් ඉදිරිපත් කර අවසන් කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් සියළුම අමාතයංශ ලේකම්වරුන් වෙත දන්වන ලදී.<br>පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන මඟින් සිදු කරන ලද ව්‍යාපෘති වෙනුවෙන් මිලියන 74 ක 50% කටත් අවම මට්ටමක බිල් ඉදිරිපත්ව ඇති අතර උපමාන පාදක ප්‍රාදේශිය කොට්ඨාශ වැය වැඩි ප්‍රමාණයක් ඉදිරිපත් වී ඇති බැවින් එම වැය තව දුරටත් ඉදිරිපත් වුවහොත් පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන වැය වලට හිලව් කිරීමට තීරණය කරන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම් / ඉංජිනේරු/ මූල්‍ය) |
| 03 | කාර්ය සාධන තරඟාවලිය හා වෙබ් අඩවි තරඟාවලිය | කාර්ය සාධන තරඟාවලිය / වෙබ් අඩවි තරඟාවලිය හා ත්‍යාග ප්‍රධානෝත්සවය ඉතා සාර්ථක ලෙස සිදු කිරීම වෙනුවෙන් ප්‍රධාන ලේකම් විසින් ස්තූතිය පල කල අතර ජයග්‍රහණය කළ සියලු ආයතන වෙත සුභාසිංශන පල කරන ලදී.<br>එමෙන්ම මෙම තරඟාවලියේදී අඩු කාර්ය සාධන මට්ටමක් පෙන්නුම් කර ඇති සියලුම ආයතන කැඳවා වැඩි කාර්ය සාධන මට්ටමකට ලඟා විමට උපදෙස් ලබා දීමටත් මෙම තරඟ සඳහා ඉදිරිපත් නොවූ ආයතන ලිඛිතව දැනුවත් කිරිමටත් ගරු ආණ්ඩුකාරතුමා උපදෙස් ලබා දී ඇති බව ප්‍රධාන ලේකම් විසින් දන්වන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) |

| | | | |
|---|---|---|---|
| 04 | වෙබ් අඩවි යාවත්කාලීන කිරීම සම්බන්ධව | වෙබ් අඩවි සම්බන්ධ කටයුතු තොරතුරු තාක්ෂණ සම්පත් සංවර්ධන අධිකාරිය මඟින් සිදු කරන අතර වෙබ් අඩවි යාවත්කාලීන කිරීමේ කටයුතු එම ආයතනය මඟින් දෛනිකව සිදු කිරීමේ ගැටළුවක් පවතින බවට නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) විසින් කරුණු ඉදිරිපත් කරන ලදී.ඒ අනුව වෙබ් අඩවි සම්බන්ධ කටයුතු තම ආයතනයේ නිලධාරියෙකු විසින් හෝ වෙනත් ආයතනයක් මඟින් සිදු කර ගැනීමේ හැකියාව සම්බන්ධව තොරතුරු තාක්ෂණ සම්පත් සංවර්ධන අධිකාරිය වෙතින් කරුණු විමසා බලා තීරණයක් ගැනීම සුදුසු බව තීරණය විය. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) |
| 05 | සමූහ ජීවිත රක්ෂණාවරණය සම්බන්ධව | සමූහ ජීවිත රක්ෂණාවරණය සම්බන්ධයෙන් බස්නාහිර පළාත් සභා ගොඩනැගිල්ලේ අමාත්‍යාංශ ලේකම්වරුන් , ආයතන ප්‍රධානීන් හා අංශ ප්‍රධානීන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්වීමට කටයුතු කළ බවත් ඒ අනුව රක්ෂණාවරණය සඳහා සම්බන්ධ වීමේ යම් ප්‍රගතියක් දක්නට ලැබෙන නමුත් එය ප්‍රමාණවත් නොවන බවත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) විසින් කරුණු දක්වන ලදී.<br>ඒ අනුව මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා සියලුම ආයතන ප්‍රධානීන් / අංශ ප්‍රධානීන්ගේ දායකත්වය සක්‍රියව ලබා දෙන ලෙස ඉල්ලා සිටින ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) |
| 06 | බස්නාහිර පළාත් සභාව සතු නිල නිවාස තොරතුරු යාවත්කාලීන කිරීම සම්බන්ධව | බස්නාහිර පළාත් සභාවේ අමාත්‍යාංශ , දෙපාර්තමේන්තු හා අනිකුත් ආයතන සතු නිල නිවාස සම්බන්ධව මෙතෙක් තොරතුරු ලබා ගැනීමක් සිදුකර නොමැති අතර මේ වන විට එම නිල නිවාස සම්බන්ධව නිවැරදි තොරතුරු පද්ධතියක් සකස් කරමින් පවතින බව නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) විසින් කරුණු ඉදිරිපත් කරන ලදී.<br>මෙම නිල නිවාස රාශියක් නඩත්තු කිරීමට පියවර ගෙන නොමැති අතර නඩත්තු වීමක් සිදු වී නොමැති බැවින් කිසිදු නිලධාරියෙකුට ලබා දීමට කටයුතු කර නොමැති බව දක්නට ලැබෙන බවට වැඩි දුරටත් කරුණු ඉදිරිපත් කරන ලදී.බොහෝ නිලධාරීන් නිවස ආසන්න රාජකාරී ස්ථානවල සේවය කරන බැවින් නිල නිවාස ලබා ගැනීමේ අවශ්‍යතාවක් ඇතිවී නොමැති බවටත් , මෙම ගොඩනැගිලි ඵලදායී කාර්යයක් සඳහා යොදවා ගැනීමට ඉදිරියේදී පියවර ගත යුතු බව තීරණය විය. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරු හා සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු |
| 07. | වායු සමීකරණ යන්ත්‍ර නඩත්තු කටයුතු සම්බන්ධව | බස්නාහිර පළාත් සභා ගොඩනැගිල්ලේ වායු සමීකරණ පද්ධතියේ නඩත්තු කටයුතු සිදු කරනු ලබන විදුලි කාර්මික ශිල්පී ඉංජිනේරු අංශයට අනුයුක්තව පළාත් බඳ මාර්ග සංවර්ධන අධිකාරියේ තදූජිත පදනම මත බඳවාගත් සේවකයෙකු වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය වෙත සෑම වසරකම ඔහුගේ සේවය වෙනුවෙන් මුදල් ගෙවා සේවය ලබා ගන්නා බැවින් ඔහුගේ සුදුසුකම් මත පවතින පුරප්පාඩුවක් සඳහා ඔහු ඉංජිනේරු අංශයට බඳවා ගැනීමට ගරු ආණ්ඩුකාරතුමා වෙත ඉල්ලීමක් ඉදිරිපත්කර ඇති බවට නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) විසින් කරුණු ඉදිරිපත් කරන ලදී .<br>පවතින දැඩි සේවා අවශ්‍යතාවය මත මේ පිළිබඳ අවධානය යොමුකර එය සිදු කිරීමට පියවර ගන්නා බවට ආණ්ඩුකාර ලේකම් විසින් ප්‍රකාශ කරන ලදී. | ආණ්ඩුකාර ලේකම් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් පුහුණු) |

| | | | |
|---|---|---|---|
| 08. | වර්ෂ අවසාන ගිණුම් පියවීමේ කටයුතු සම්බන්ධව | 2023.12.30 හා 31 දිනයන් සති අන්ත නිවාඩු දින වන අතර 2023.12.29 දිනම ගිණුම් පියවීමේ කටයුතු සිදු කිරීමට හැකි නොවන ලෙසත් රාජකාරී අවශ්‍යතාවය මත සති අන්ත නිවාඩු දින දෙකෙහි අවශ්‍ය නිලධාරීන් රාජකාරී සඳහා වාර්තා කර ගිණුම් පියවීමේ කටයුතු සිදු කිරීමට කටයුතු කරන ලෙසත් සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් දැනුවත් කරන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරු හා සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු |
| 09. | 2024.01.01 දින නව වර්ෂයේ රාජකාරී ආරම්භ කිරීම සම්බන්ධව | ජනාධිපති කාර්යාල පරිශ්‍රයේ දී පැවැත්වෙන නිල උත්සවයට සමගාමීව බස්නාහිර පළාත් සභා කාර්යාල ගොඩනැගිලි සංකීර්ණයේ පැවැත්වෙන උත්සවය 2024 ජනවාරි මස 01 වන දින පෙ.ව.9.00 ට ගරු ආණ්ඩුකාරතුමාගේ ප්‍රධානත්වයෙන් බිම් මහලේ ප්‍රධාන ප්‍රවේශ පරියන්තයේදී පැවැත්වීමට තීරණය විය. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරු හා සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු |

එල්.ඒ.කළුකපුආරච්චි,
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන),
ප්‍රධාන ලේකම් වෙනුවට,
බස්නාහිර පළාත.

එල්.ඒ. කළුකපුආරච්චි
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන)
ප්‍රධාන ලේකම් කාර්යාලය (බ.ප.)
204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල